# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021
## 2024 සැප්තැම්බර්

## මානවශාස්ත්‍ර පීඨය

## නාට්‍ය හා රංගකලාව

## නාට්‍ය නිර්මාණය හා විචාරය DMAT – E3025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නාට්‍ය නිර්මාණයක නිෂ්පාදන ක්‍රියාවලිය පැහැදිලි කොට, ඒ ඒ අවස්ථාවල අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරය සහ වගකීම් මොනවාදැයි පැහැදිලි කරන්න.

02. "නාට්‍ය යනු පිටපත (Text) අර්ථකතනය (Interpretation) කිරීමයි." මේ මතය සමගින් ඔබ එකඟ වන්නේද? හේතු දක්වන්න.

03. නාට්‍ය නිර්මාණයක නිෂ්පාදන කාර්යය සැලකිල්ලට ගෙන, නිෂ්පාදන කළමනාකරුගේ සහ වේදිකා කළමනාකරුගේ කාර්යභාරය පැහැදිළි කරන්න.

04. නාට්‍ය කෘතියක් අර්ථකතනය කිරීමේදී රංගාලෝක නිර්මාණ කාර්යයේ (Light Design) ඇති වැදගත්කම උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

05. නාට්‍ය නිර්මාණයක් සාර්ථක කරගැනීම සඳහා වේදිකා පසුතල නිර්මාණ කාර්යය (Set Design) දායක වන අයුරු උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

06. නාට්‍ය නිර්මාණයක අර්ථ නිරූපණය සිදු කිරීම සඳහා රංග වින්‍යාසය (Theater Choreography) දක්වන දායකත්වය උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න.

07. රූපණය යනු කුමක්දැයි පැහැදිලි කොට, ස්ටැනිස්ලව්ස්කිගේ රූපණ විධික්‍රමය (Method Acting ) අනුව චරිත නිරූපණයකදී රූපණ ශිල්පියා සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

08. සෞන්දර්යයාත්මක ආකල්ප සහ සෞන්දර්යයාත්මක නොවන ආකල්ප නාට්‍ය රසවින්දනයට ඇති කරන බලපෑම පෙන්වා දෙන්න.

***********************************